# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,734 — 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද — 30.4.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


## III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | 817 |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | 875 |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | 882 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 883 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම

### සබරගමු පළාත

**ඉලක්කම 14579**—ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1959යේ ජූනි මස 3වෙනි දින වූ බදාදා පෙරවරු 11ට රක්වාන තානායමේදී විකිණීමට නොහොත් වෙනත් අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත.

සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැද පත්තුවේ පිහිටා තිබෙන බිම් කැබලි දහහතරක්.

ලංකා මැනීමේ ගම් සිතියමේ අංක 699—රක්වාන (කොටසක්)

**බිම් කැබෙල්ලේ නොම්මරය : 121.**

ඉඩමේ නම : ගගේහේනෙවත්ත ; අයිතිකම් කියා ගිහින අයගේ නම් : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ ජුවානිස්, රක්වානේ පදිංචි කන්දෙදූරගේ එමානිස්, රක්වානේ පදිංචි කන්දෙදූරගේ නොන්නා, රක්වානේ පදිංචි කන්දෙදූරගේ සූවි, රක්වානේ පදිංචි කන්දෙදූරගේ ජනෝ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ නිකෝ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ සන්දෝරිසා, රක්වානේ පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. පියදාස, ජේ. එච්. සී. පියදාස, ඇම්. ජේම්ස් පෙරේරා, කන්දෙදූරගේ කිරි මැණිකා, කන්දෙදූරගේ කිරි කෙන්දා, බෙන්තොට, අළුත් ගම, හෙට්ටිවත්තේ පදිංචි හබිබු නයිනා මරික්කාර් පකීර් බාවා ලෙබ්බේගේ බූදල් බලකාරයා වන යූසුප් ලෙබ්බේ මරික්කාර් මොහොම්බදු මරික්කාර්, අයි. ඇල්. සේරම්මා, අයි. ඇල්. කාදර් ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : පොල් වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 15.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 122.**

ඉඩමේ නම : ගඟඅද්දරවත්ත ; අයිතිකම කියාහිටින අයගේ නම් : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ ජුවානිසා, රක්වානේ පදිංචි කන්දෙදූරගේ එමානිස්, රක්වානේ පදිංචි කන්දෙදූරගේ නොන්නා, රක්වානේ පදිංචි කන්දෙදූරගේ සූවි, රක්වානේ පදිංචි කන්දෙදූරගේ ජනෝ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ නිකෝ, රක්වානේ පදිංචි කන්දෙදූරගේ සන්දෝරිසා, රක්වානේ පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. පියදාස, අයි. ඇල්. සේරම්මා, අයි. ඇල්. කාදර්, කන්දෙදූරගේ කිරි මැණිකා, කන්දෙදූරගේ කිරිකෙන්දා, බෙන්තොට, අළුත් ගම, හෙට්ටිවත්තේ පදිංචි හබිබු නයිනා මරික්කාර් පකීර් බාවා ලෙබ්බේගේ බූදල් බලකාරයා වන යූසුප් ලෙබ්බේ මරික්කාර් මොහොම්මදු මරික්කාර් ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග ; පොල්වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 21.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 131.**

ඉඩමේ නම : තිප්පොලෙහේන, තිප්පොලෙවත්ත ; අයිතිකම් කියාගිටින අයගේ නම් : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ, රක්වානේ පදිංචි සම්සදීන් මරික්කාර්, රක්වානේ පදිංචි සේනදීන් මරික්කාර්, රක්වානේ පදිංචි අබ්දුල් මජීදු, කළුතර පරණ පාරේ, අංක 65 දරණ ස්ථානයේ පදිංචි ලැම්පිනා ද අල්විස් සූරිය ආරච්චි මහත්මිය සහ තවත් අය ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : පොල්වත්ත ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 38.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 132.**

ඉඩමේ නම : ඔරේන්ජ්ෆීල්ඩ් වත්ත ; අයිතිකම් කියාගිටින අයගේ නම් : කොළඹ, බාර්න්ස් පෙදෙසේ අංක 81 දරණ ස්ථානයේ පදිංචි මොහමඩ් අලි මොහමඩ් ඉස්මයිල්, ඇම්. ඒ. ඇම්. හුසේන් ඉස්මයිල්, සුබෙයිදා උම්මා මහත්මිය, කොළඹ, වේල්ල වීදියේ අංක 74 දරණ ස්ථානයේ පදිංචි ඇම්. ඒ. ඇම්. මුමී උම්මා ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : නෝ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 38.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 206.**

ඉඩමේ නම : ගලන්දෙහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම් : කහවත්තේ, අටකලන්පන්නේ, කවුඩුවාවේ පදිංචි කේ. ඩී. පුංචි අප්පුහාමි ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 1, රූ. 3, ප. 37.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 216.**

ඉඩමේ නම : කුඩුගලෙහේන ; අයිතිකම් කියා සිටින අයගේ නම : රත්නපුර පදිංචි අබ්දුල් අසීස් මොහම්මදු මාර්ගනි සහ එච්. ඇම්. ෂකාරියා ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 2, රූ. 1, ප. 13.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 221.**

ඉඩමේ නම : ගලන්දෙහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 38.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 236.**

ඉඩමේ නම : ගගඅද්දරහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 2, රූ. 2, ප. 37.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 238.**

ඉඩමේ නම : ගගේහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 23.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 241.**

ඉඩමේ නම : කුඩුගලහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රත්නපුර පදිංචි අබ්දුල් අසීස් මොහොම්මදු මාර්ගනි සහ එච්. ඇම්. ෂකාරියා ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 0.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 242.**

ඉඩමේ නම : කුඩුගලහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රත්නපුර පදිංචි අබ්දුල් අසීස් මොහොම්මදු මාර්ගනී සහ එච්. ඇම්. ෂකාරියා ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 12.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 244.**

ඉඩමේ නම : මොරගහඅතුරේහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 0.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 246.**

ඉඩමේ නම : දිගනගොඩහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 9.

**බිම් කැබෙල්ලේ නොම්මරය : 248.**

ඉඩමේ නම : දිගනගොඩහේන ; අයිතිකම් කියාගිටින අයගේ නම : රක්වානේ පදිංචි දෙන් චාර්ල්ස් රණසිංහ ; කොයි අන්දමේ ඉඩමක්ද යන වග : හේන ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 35.

තක්සේරු මිල, අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන් ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල්තුමාගෙන් ද ලබාගත හැකි වේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

1959 අප්‍රේල් 30 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කායාීලයේදිය.

# ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිතවූ 1950 අංක දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම කෝරළයේ කොටදෙනියාව, එරබද්ද සහ කරබොටුවාව යන ගම්වල පිහිටි තලගහමුලපිල්ලැව හෙවත් දළුගමආගරේ, මුරුතගහඹිටකුඹුර, දෙල්ගොල්ලකුඹුර, දෙල්ගොල්ලවත්ත, කනුහැත්ත, පන්වල, පාළුවත්ත, කිවුල්මහලියද්ද, තලගස්කුඹුර, කරබොටුවාවකුඹුරේ-වාගල සහ දළුගමආගරේ යන ඉඩම්වලින් අක්කර 0, රූ. 5, ප. 0 පමණ විශාලකම් ඇති ඉඩම් කැබැලි 14කට මායිම් :—

1. තලගහමුලපිල්ලැව හෙවත් දළුගමආගරේ, පාර්චස් 17ක පමණ ප්‍රමාණය, කොටදෙනියාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : කුඩා ඔය ; දකුණට : කේ. පියදාස සහ තවත් අයට අයිති දළුගමආගරේ යන ඉඩම ; බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

2. මුරුතගහඹිටකුඹුර, පාර්චස් 7.0ක පමණ ප්‍රමාණය, කොටදෙනියාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩී. ඈන්. කරුණාරත්න සහ තවත් අය අයිතිකම් කියන දෙල්ගොල්ලේකුඹුර යන ඉඩම ; දකුණට : කුඩාඔය ; බස්නාහිරට : කුඩාඔය සහ කේ. පී. තේගිස්සිංඤෝ අයිතිවාසිකම් කියන එම ඉඩමේම කොටසක්.

3. දෙල්ගොල්ලකුඹුර : පාර්චස් 35.5ක පමණ ප්‍රමාණය, කොටදෙනියාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට : ඒ. ඉගෝනිස් සිංඤෝ අයිතිකම් කියන මුරුතගහඹිට කුඹුර සහ එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : කුඩාඔය සහ ඩී. එච්. කරුණාරත්න සහ තවත් අය අයිතිකම් කියන දෙල්ගොල්ලවත්ත යන ඉඩම ; දකුණට සහ බස්නාහිරට : කුඩා ඔය.

4. දෙල්ගොල්ලවත්ත : පාර්චස් 16ක පමණ ප්‍රමාණය, කොටදෙනියාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ සී. ඩී. බණ්ඩාරනායක අයිතිකම් කියන කනුහැත්ත යන ඉඩම ; දකුණට : කුඩාඔය ; බස්නාහිරට : ඩී. එච්. කරුණාරත්න සහ තවත් අය අයිතිකම් කියන දෙල්ගොල්ල කුඹුර යන ඉඩම.

5. කනුහැත්ත : පාර්චස් 30.7 පමණ ප්‍රමාණය, එරබැද්ද යන ගමේ, ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩී. එච්. කරුණාරත්න අයිතිකම් කියන දෙල්ගොල්ලවත්ත යන ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට සහ බස්නාහිරට : කුඩා ඔය.

6. කනුහැත්ත : පාර්චස් 04.0ක පමණ ප්‍රමාණය, එරබද්ද යන ගමේ, ඊට මායිම් :—

උතුරට, නැගෙනහිරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ; බස්නාහිරට : කුඩා ඔය.

7. පන්වල : පාර්චස් 12.8ක පමණ ප්‍රමාණය, කරබොටුවාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : කුඩාඔය ; දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ; බස්නාහිරට : කුඩාඔය සහ කේ. පීරිස්සිංඤෝ සහ තවත් කෙනෙක් අයිතිකම් කියන පාළුවත්ත යන ඉඩම.

8. පාළුවත්ත : පාර්චස් 09.0ක පමණ ප්‍රමාණය, කරබොටුවාව යන ගමේ, ඊට මායිම් :—

උතුරට : කුඩාඔය ; නැගෙනහිරට : කේ. රපියල් සිංඤෝ අයිතිකම් කියන පන්වල යන ඉඩම ; දකුණට : එම ඉඩමේම ඉතිරි කොටසක් ; බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඒ. ආර් ජේදිරිස් සිංඤෝ අයිතිකම් කියන කිවුල්මහලියද්ද යන ඉඩම.

9. කිවුල්මහලියද්ද: පාර්චස් 12.5ක පමණ ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට: කුඩාඔය සහ ඇල්. ඇන්. ඒ. බබාහාමි අයිතිකම් කියන තල්ගස්මුලකුඹුර; නැගෙනහිරට: කුඩාඔය; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස සහ කේ. පීරිස් සිංඤෝ සහ තවත් කෙනෙක් අයිතිකම් කියන පාළුවත්ත යන ඉඩම; බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස.

10. තලගස්මුලකුඹුර: පාර්චස් 18.5ක පමණ ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට: කුඩාඔය; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස සහ ඒ. ආර්. සේදිරිස් සිංඤෝ අයිතිකම් කියන කිවුල්මහලියද්ද යන ඉඩම; බස්නාහිරට: කුඩාඔය සහ කේ. මැනික්හාමි අයිතිකම් කියන කරබොටුවාවකුඹුරේ-වාගල යන ඉඩම.

11. කරබොටුවාවකුඹුරේ-වාගල: පාර්චස් 07.0ක පමණ ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට: කුඩාඔය; නැගෙනහිරට: එම ඉඩමේම ඉතිරි කොටස සහ ඇල්. ඇන්. ඒ. බබාහාමි අයිතිකම් කියන තලගස්මුලකුඹුර; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස; බස්නාහිරට: කුඩාඔය සහ කේ. පි. ඇල්බින්සිංඤෝ සහ තවත් කෙනෙක් අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්.

12. කරබොටුවාව-කුඹුරේ-වාගල: පාර්චස් 08.0ක පමණ ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට: කුඩාඔය; නැගෙනහිරට: කේ. මැනික්හාමි අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස; බස්නාහිරට: කේ. පීටර් අයිතිකම් කියන එම ඉඩමේම කොටස.

13. කරබොටුවාවකුඹුරේ-වාගල: පාර්චස් 09.0ක පමණ ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට: කුඩාඔය; නැගෙනහිරට: කේ. පි. ඇල්බින් සිංඤෝ සහ තවත් කෙනෙක් අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස; බස්නාහිරට: කේ. පියරත්න සහ තවත් අය අයිතිකම් කියන දළුගමආගරේ යන ඉඩම.

14. දළුගමආගරේ: පාර්චස් 09.0ක ප්‍රමාණය, (කරබොටුවාව යන ගමේ), ඊට මායිම් :—

උතුරට: කුඩාඔය සහ සී. සී. බ්‍රිටෝ මුතනායගම් අයිතිකම් කියන තලගහමුලපිල්ලැව් හෙවත් දළුගම්ආගරේ යන ඉඩම; නැගෙනහිරට: කුඩාඔය; දකුණට: කේ. පීටර්ට අයිති කරබොටුවාවකුඹුරේ-වාගල යන ඉඩම සහ එම ඉඩමේම ඉතිරි කොටස; බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංක කියු. බී. 243/ජේ 56 ඇල් 339.

1958ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ "ඒ" කොට්ඨාශයේ බඩල්ගම පිහිටි බඩල්ගම ඇස්ටේට් යන ඉඩමෙන් අක්කර 50ක පමණ විශාලකම් ඇති කොටසකට මායිම් :—

උතුරට: එම් ඉඩමේම කොටසක්; නැගෙනහිරට: එම ඉඩමේම කොටසක් සහ වත්තේ කරත්ත පාර; දකුණට: මීගමු-ගිරිඋල්ල පි. ඩබ්ලිව්. ඩී. පාර; බස්නාහිරට: එම ඉඩමටම අයිති කුඹුරු සහ ඇන්. සී. ආරොන් ප්‍රනාන්දු සහ කේ. ඒ. ඩැනියල් අප්පුහාමි අයිතිකම් කියන ඉඩම සහ රජය සතු ඉඩමද. (පී. පී. ඒ. 1,301).

අංකය: කියු. බී. 339/ජේ 57/58 ඇල් 742 (වී.ඊ.)

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1959 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ වේවැල්දෙනිය පහළගම යන ගමේ පිහිටි තුත්තිරිහේන යන ඉඩමෙන් අඩි 308×9ක පමණ කොටසකට මායිම් :—

උතුරට: ඇන්ජී./වේවැල්දෙනියේ රජයේ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම (රජය සතු); නැගෙනහිරට සහ බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස; දකුණට: මීරිගම-වේවැල්දෙනිය පී. ඩබ්ලිව්. ඩී. පාර.

අංකය: කියු. බී. 349/ජේ 58/59 ඊ. 54.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1959 මාර්තු මස 24 වැනි දින,
කොළඹදීය.

---

ඇල්එච්/ඩී. 15.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපණතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ ආදායම් පාලක කොටසේ වරාපිටිය නම් ගමේ පිහිටි අ. 1, රූ. 2, ප. 0ක් පමණ ප්‍රමාණය ඇති කොයින්දගොඩහේන නම් ඉඩම් කොටසට මායිම් :—

උතුරට: කේ. අල්ලිස් ද සිල්වා හා තවත් අයට අයත් බෙරවකොටුන්න නම් කුඹුරු ඉඩම් කොටස; නැගෙනහිරට: ගම්සභා පාර; දකුණට: කේ. අල්ලිස් ද සිල්වා අයිතිකම් කියන කොයින්දගොඩහේන නම් ඉඩම් කොටස; බටහිරට: ඇන්. එච්. පැනිස් සිල්වා හා තවත් අයට අයත් කොයින්දගොඩලින්ද නම් ඉඩමින් කොටසක්.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංකය: ජේ 57/58 ඊ 608/ඇල්එච්/ඩී. 15.

1959ක් වූ මාර්තු මස 10 වැනි දින,
කොළඹදීය.

---

ඇල්එච්/ඩී. 23.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපණතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ආදායම් පාලක කොටසේ ලබුගම ගමේ පිහිටි අ. 1, රූ. 1, ප. 0ක් පමණ ප්‍රමාණය ඇති පොට්ටහේන නොහොත් පොට්ටදෙනියහේන නම් ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුරට: ආර්. ඩී. පී. පෙරේරා අයිතිකම් කියන හල්ගහලියැද්ද නම් ඉඩම; නැගෙනහිරට: යාල්ගල-ලබුගම ගම්සභා පාර; දකුණට: රජය සතු කළු/ලබුගම සිංහල මිශ්‍ර පාසලට අයත් ඉඩම; බටහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස.

(2) කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ආදායම් පාලක කොටසේ ලබුගම ගමේ පිහිටි පර්චස් 7ක් පමණ වූ පොට්ටගේන නොහොත් පොට්ටදෙනියගේන නම් ඉඩමට මායිම් :—

උතුරට හා දකුණට හා බටහිරට : ඇල්. මයිත්‍රිපාල හා තවත් අයට අයත් මෙම ඉඩමේම ඉතිරි කොටස් ; නැගෙනහිරට : රජය සතු කළු/ලබුගම සිංහල මිශ්‍ර පාසල් වත්ත.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ 57/58 ඊ 744/ඇල් එච්/ඩී 23.

1959ක් වූ මාර්තු මස 18 වැනි දින
කොළඹදීය.

---

ඇල්. එච්/ඩී. 3.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මේහි පහත් විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළයේ ආදායම් පාලක කොටසේ මහ කළුපහන නම් ගමේ පිහිටි අ. 0, රූ. 2, ප. 1.2 ක් පමණ මුළු ප්‍රමාණය ඇති නාගන්තොටකුඹුර, හොරිකුඹුර, හෙලම්බගහආරාව, වැලිඹිට්ට, මහකුඹුර හා අඹගහආරාව නම් ඉඩම් කොටස් 7ට මායිම් :—

1. **නාගන් තොටකුඹුර**—ප්‍රමාණය : ප. 31.5ක් පමණ.

උතුරට : හොරවල සිට මූකලානා තෙක් විහිදී ඇති පාර ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : රජය සතු සොහොන් බිම වූ කුරුඳුගහ ගොඩැල්ල නම් ඉඩම හා ඩී. ඒ. පතිරාජට අයත් හොරිකුඹුර නම් ඉඩම ; බස්නාහිරට : ඩී. ඒ. පතිරාජට අයත් හොරිකුඹුර නම් ඉඩම.

2. **හොරිකුඹුර**—ප්‍රමාණය : ප. 0.2ක් පමණ.

උතුරට : ජී. ඩී. පොඩිසිංඤෝ හා තවත් අයට අයත් නාගන්තොට කුඹුර නම් ඉඩම ; නැගෙනහිරට : රජය සතු සොහොන් බිම වූ කුරුඳුගහගොඩැල්ල නම් ඉඩම ; දකුණට හා බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

3 **හෙලම්බගහ ආරාව**—ප්‍රමාණය : ප. 16.0ක් පමණ.

උතුරට රජය සතු සොහොන් බිම වූ කුරුඳුගහගොඩැල්ල නම් ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : හොරවල ඇල ; බස්නාහිරට : ඩී. ඒ. පතිරාජට අයත් හොරිකුඹුර නම් ඉඩම.

4. **හෙලම්බගහආරාව**—ප්‍රමාණය : ප. 10.0ක් පමණ.

උතුරට : හොරවල ඇල ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : පී. ජී. රොමියල් සිංඤෝට අයත් වැලිඹිට්ට නම් ඉඩම ; බස්නාහිරට : කේ. ඇම්. පුරන්සිකු හා තවත් අයට අයත් මහකුඹුර නම් ඉඩම.

5. **වැලිඹිට්ට**—ප්‍රමාණය : ප. 7.5ක් පමණ.

උතුරට : කේ. ඇම්. ඇක්මන්ට අයත් හෙලම්බගහආරාව නම් ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට හා බස්නාහිරට : කේ. ඇම්. පුරන්සිකු හා තවත් අයට අයත් මහකුඹුර නම් ඉඩම.

6. **මහකුඹුර**—ප්‍රමාණය : ප. 4.5ක් පමණ.

උතුරට : පී. ජී. රොමියෙල් සිංඤෝට අයත් වැලිඹිට්ට නම් ඉඩම ; නැගෙනහිරට හා බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : බී. ඇම්. ලියන්දිරිස්හාමිට අයත් අඹගහආරාව නම් ඉඩම.

7. **අඹගහආරාව**—ප්‍රමාණය : ප. 11.5ක් පමණ.

උතුරට : කේ. ඇම්. පුරන්සිකු හා තවත් අයට අයත් මහකුඹුර නම් ඉඩම ; නැගෙනහිරට හා බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස් ; දකුණට : කේ. ඇම්. ඇක්මන් හා තවත් අයට අයත් වෙදගෙවත්ත නම් ඉඩම.

අංකය : ජේ. 57/58 ඇල් 212/ඇල් එච්/ඩී. 3.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1959 ජනවාරි 29 වැනි දින,
කොළඹ දීය.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කහල්ල ගම්මුලාදෑනි වසමෙහි පල්ලේගම්මැද්ද ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 9, රූඩ් 2, පර්චස් 22.8ක් පමණවූ මූලික සිතියම් අංක ඒ1248හි කැබලි අංක 126, 127, 128, 129, 130, 131, 132, 133, 134, 135 සහ 136න් කොටසක්වූ මෙහි පහත මායිම් සඳහන් ඉඩම් කැබලි 11.

උතුරට : පාර, බී. පී. පර්සි පෙරේරා සහ වී. ජී. රන්කිරි විසින් අයිතිවාසිකම් කියනු ලබන අඹගහවෙල කුඹුර සහ පුස්සැල්ල ඔය ;

නැගෙනහිරට : පුස්සැල්ල ඔය සහ ගරු පී. පඤ්ඤානන්ද ස්ථවිරයන් විසින් අයිතිවාසිකම් කියනු ලබන ඒදණ්ඩකොටුව නමැති ඉඩම ;

දකුණට : පී. බී. විජේසිංහ මහත්මිය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඒදණ්ඩකොටුව නමැති ඉඩම සහ ඇම්. අර්නෝලිස් සිංඤෝ විසින් අයිතිවාසිකම් කියනු ලබන කැබලි අංක 136හි ඉතිරි කොටස ;

බස්නාහිරට : ශ්‍රී දළදා පිරුවන විහාරවත්ත, බී. කේ. මුදියන්සේ සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන හේනගෙදර වත්ත, පී. බී. විජේසිංහ මහත්මිය සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඔතනපිටියේ වත්ත සහ රත්නායක මහත්මයා සහ අනිකුත් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන පල්ලේ පිටියේ හේන, (ඉඩම මැදින් වැටී ඇති ගම්සහා පාර රහිත).

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ 57/58 පී 683/ඇල් ඩී/ඊ/11.

1959ක් වූ මාර්තු මස 13 වැනි දින,
කොළඹදීය.

---

අංකය :3/41/65

## 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණත

### 5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතෙන් සංශෝධිත 1950හේ අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ උඩුපිහිල්ල ගමේ පිහිටි අක්කර දෙකක් පමණ ඇති නාරන්ගහමුලහේන වත්ත හෙවත් නාරනගස් පිටියේ වත්ත, සහ ඊට මායිම් :—

උතුරට : පුරිජ්ජල කුඹුරුවලට යාමට ඇති ගම්කාර්ය සභාපාර ; නැගෙනහිරට : පී. ඇල්. ගුණදාස අයිතිකම් කියන මාලිගාවේ වත්ත, යූ. කේ. පිකිරිබන්ඩා සහ යූ. කේ. පුංචිබන්ඩා අයිතිකම් කියන අප්පුවාගේ නායලාගේ වත්ත හෙවත් අස්වැද්දුම (රජයට ගැනීමට යන ඉඩම) ; දකුණට : වරකාරමුට යන ප්‍රධාන පාරෙන් වැටී ඇති ගම්කාර්ය සභා පාර ; බස්නාහිරට : ටී. පී. ජයසේකර අයිතිකම් කියන වැලිගලගෙදර දුරයලාගේ ගෙදර වත්ත නමැති ඉඩම සහ පුරිජ්ජල කුඹුරුවලට යන ගම්කාර්ය සභා පාර.

2. මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ උඩුපිහිල්ල ගමේ පිහිටි අප්පුවාගේ නයාලාගේ වත්ත හෙවත් අස්වැද්දුම නමැති ඉඩමෙන් පර්චස් 20 ක පමණ බිම් ප්‍රමාණය සහ ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතුරු කොටස ; නැගෙනහිරට : ඇල : දකුණට සහ බස්නාහිරට : මුත්තුසාමි මහත්මිය අයිතිකම් කියන නාරන්ගස්පිටියවත්ත හෙවත් නාරංගහමූලහේන වත්ත (රජයට ගැනීමට යන ඉඩම).

සඳහන් කළ යුතු අංකය : ජේ 57/58 ඊ 801.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1959ක්වූ මාර්තු මස 26 වැනි දින
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත්, එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ කඩේවීදිය උතුර ගම්මුලාදෑනි වසමේ කඩේ වීදියේ පිහිටි මාතර නගර සභාවේ අංක 7 දරණ ඡන්ද කොට්ඨාශයේ බතුතා පාරේ වරිපනම් අංක 22/2 දරණ අඹගහවත්ත නමැති ඉඩමෙන් අක්කර 1½ක පමණ කොටසක්, ඊට මායිම් :—

උතුරට : හාල්පාහිනවත්ත නමැති ඉඩම ; නැගෙනහිරට : රජයට ගන්නා ලද එම ඉඩමේ ඉතිරි කැබැල්ල සහ එන්. එච්. එම්. හඩාඩ් මහතා සහ එම්. හස්.සන් මහත්මිය යන අයට අයිති ඉඩම් වන ජාසිංගෙවත්ත සහ උළුගෙදරවත්ත ; දකුණට : රජයට ගන්නා ලද එම ඉඩමේ ඉතිරි කැබැල්ල ; බස්නාහිරට : බතුතා පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ. 57/58. ඊ. 447/එල්. බී./2382.

1959 අප්‍රේල් 1 වැනි දින,
කොළඹ දීය.

---

අංකය ජේ 57/58 එල් 306—එල් බී 2370

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිතවූ 1950 අංක දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

1. මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරළේ ප්‍රාදෙශීය ආදායම් නිලධාරි කොටස තුළ, දම්පැල්ල ගම් මුලාදෑනි වසමේ වෙළඳගොඩ ගමේ පිහිටි රුක්අත්තනගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 5.1 පමණ ප්‍රමාණ බිම් කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කැබැලි ; නැගෙනහිරට : මූලික සිතියම් අංක ඒ 877තේ ලොට් 6 දරණ රජයට ගන්නා ලද කැබැල්ල.

2. මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරළේ ප්‍රාදෙශීය ආදායම් නිලධාරි කොටස තුළ දම්පැල්ල ගම් මුලාදෑනි වසමේ වෙළඳගොඩ ගමේ පිහිටි ගනුවලමුල්ල නමැති ඉඩමෙන් පර්චස් 7.35 ක් පමණ විශාල බිම් කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල ; නැගෙනහිරට : ඇල ; දකුණට : මූලික සිතියම් අංක ඒ 877තේ ලොට් 7 දරණ රජයට ගන්නා ලද කැබැල්ල ; බස්නාහිරට : රුක්අත්තනගහවත්ත නමැති ඉඩම.

3. මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරළේ ප්‍රාදෙශීය ආදායම් නිලධාරි කොටස තුළ දම්පැල්ල ගම් මුලාදෑනි වසමේ පහළගනේ ගම පිහිටි වළඳනකැටිය නමැති ඉඩමෙන් පර්චස් 20ක් පමණ ප්‍රමාණ බිම් කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල ; නැගෙනහිරට : මුල්ල වත්ත නමැති ඉඩම ; දකුණට : මූලික සිතියම් අංක ඒ 877තේ ලොට් 10 දරණ රජයට ගන්නා ලද කැබැල්ල ; බස්නාහිරට : ඇල.

4. මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරළේ ප්‍රාදෙශීය ආදායම් නිලධාරි කොටස තුළ දම්පැල්ල ගම් මුලාදෑනි වසමේ පහළගනේ ගම පිහිටි මුල්ලෙවත්ත නමැති ඉඩමෙන් පර්චස් 14.7ක් පමණ ප්‍රමාණ බිම් කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි ; දකුණට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල සහ වළඳනකැටිය නමැති ඉඩම ; බස්නාහිරට : මූලික සිතියම් අංක ඒ 877තේ ලොට් 10 දරණ රජයට ගන්නා ලද කැබැල්ල.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1959ක්වූ අප්‍රේල් මස 6 වැනි දින
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිතවූ 1950 අංක දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ දික්වැල්ල දකුණ ගම්මුලාදෑනි වසමේ බේරුවලවිල නමැති ගමේ පිහිටි මහකුඹුර නමැති ඉඩමෙන් අක්කර 2½ක පමණ කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට : සද්ධාතිස්ස පාර ; නැගෙනහිරට : සුමනදාස මුතුකුමාරණ සහ තවත් අයට අයිති ලියනආරච්චිගෙකුඹුර නමැති ඉඩම ; දකුණට : දෙපෙව පිට ඇල ; බටහිරට : නම්බුකාර පල්ලියෙ ගුරුගේ හෙන්දියස්අප්පු නමැති අයට අයිති තලගහකුඹුර නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ 55 එච් ඒ 151/එල් බී/2257.

1959ක්වූ අප්‍රේල් මස 1 වැනි දින
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් මාවත්ත නමැති ගමෙහි පිහිටි පැලපොල්වත්ත නමැති අක්කර 1½ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : කු/මාවත්ත පාඨශාලාවත්ත (රජයේ ඉඩම) සහ පන්සල් වත්ත ; දකුණට : පින්කුඹුර ඇල ; බස්නාහිරට : ඒ. ඇම්. පොඩිමහත්මයා මහත්මිය හිමිකම් කියන මීගහමුලවත්ත (නොහොත්) පැලපොල්වත්තේ හේන නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : 3/63/40/ජේ 57/58 ඊ.715.

1959ක්වූ අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹදීය.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතෙන් සංශෝධනය කරණ ලද පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබගැනීමේ ආඥපණතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයිති යක්කාවිට නම් ගමෙහි පිහිටි (අංක 12ඒ දරණ මූ. සි. දක්වෙන කට්ටි නො 2) අවුව්බැදිගලගාව හේන නමින් හැඳින්වෙන අ. 1, රූ. 0, ප. 05ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි ඉඩම :—

උතුරට : කේ. ඇම්. සෙනෙවිරත්න සහ ඇස්. ඒ. ඇම්. පීටර් සිංඤෝ යන අයට හිමි අවුවබැදිගලහාවහේන නොහොත් කෝන් ගහමුල හේන නොහොත් අඳුග්ගල කෝන් ගහමුලහේන (අංක 12 ඒ දරණ මූ. සි. දක්වෙන කට්ටි නො. 1) ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : ඇස්. ඒ. ඇම්. සිරිසේන හිමිකම් කියන නුගවෙලගාවහේන නමැති ඉඩම ; බස්නාහිරට : පින්නපොල —අඹගම්මන ගම්සභා පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : 3/63/30
ජේ. 57/58. ඊ 417

1959ක්වූ අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතෙන් සංශෝධනය කරණ ලද පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබගැනීමේ ආඥපණතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩ විල්ලි හත්පත්තුවේ ආදායම් පාලක නිල්ධාරි තැනගේ කොට්ඨාශයට අයිති කුරුණෑගල නගර සභා සීමාවේ අංක 5 දරණ කොට්ඨාශයට අයිති වරිපනම් අංක 149 දරණ කන්දේ හේන නමින් හැඳින්වෙන නො. 58 දරණ නාගරික මැනුම් සැලැස්මේ අයි 14/433 දරණ පතෙහි දක්වෙන අ. 0, රූ. 2, ප. 07, 1 පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි 9 වෙනි බිම් කැබැල්ල :—

උතුරට සහ නැගෙනහිරට : අංක 58 දරණ නා. මැ. සැ. අයි. 14/433 දරණ පතෙහි දක්වෙන කට්ටි නො. 10 දරණ අපිපින් නොහොත් ජුනෙයඩීන්ට හිමි ඉඩම් ; දකුණට : කුරුණෑගල-දඹුල්ල ප්‍රසිඛ පාර ; බස්නාහිරට් : අංක 58 දරණ නා. මැ. සැ. අයි. 14/433 දරණ පතෙහි දක්වෙන කට්ටි නො. 33 දරණ උරුපාකඩ විහාරයේ භාරකාරයන් හට හිමි ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : 3 63/53
ජේ 57 පී 500

1959ක්වූ අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹදීය.

---

අංකය : 3/62/1/102.

## 1954රේ අංක 39 දරන (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශෝධිත) ආඥපණතෙන් සංශොධිත 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ ලන්කාරුන්ගෙදර හා වේවැල්ල නමැති ගම්වල පිහිටි දනට ඇල්හේනවත්ත වශයෙන් හැඳින්වෙනු බද්දේගමවත්ත (නො: 2,588 දරන අවසාන ගම්මැනීමේ සැලැස්මේ කැබැලි 33 හා 34) සහ ඉබ්බන්වලවත්ත (නො. 2,594 දරන අවසාන ගම්මැනීමේ සැලැස්මේ කැබැලි 26) නමැති ඉඩ වලින් අ. 19, රූ. 3, ප. 11 ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : බාලම්මා විසින් හිමිකම් කියන මඩහේනවත්ත නමැති ඉඩම (නො. 2,594 දරන අ. ග. සැ. කැබැලි 26න් කොටසක්) : නැගෙනහිරට : කඩවලේ ඇල නො. 2594 දරන අ. ග. සැ. කැබැලි 42 හා 44 සහ ගම්-මායිම ; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ 57/58 ඇල් 577 (වීර්).

1959 ක්වූ අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පණත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කරගනු ලැබේ යයිද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

කෑගල්ල දිස්ත්‍රික්කුයේ ගල්බොඩ සහ කිනිගොඩ කෝරලේ පරපේ වසමේ පරපේ ගමේ පිහිටි (ඇප්. වී. පී. 96, බිම්කට්ටි 132, 133 සහ 134) යයිමන්කන්ද නොහොත් කොස්සින්න වත්තෙන් අක්කර 12ක පමණ බිම්කට්ටියක්, ඊට මායිම් :—

උතුරට : ඇප්. වී. පී. 96 දරන ප්ලෑනයේ පෙන්නුම් කරන බිම් කට්ටි නො. 132 සහ 133නේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : රඹුක්කන් ඔය ; දකුණට : ඇප්. වී. පී. 96යේ පෙන්නුම් කරන බිම්කට්ටි නො. 135 ; බස්නාහිරට : ඇප් වී. පී. 96 දරන ප්ලෑනයේ පෙන්නුම් කරන බිම්කට්ටි නො. 132 සහ 133නේ ඉතිරි කොටස්.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

සඳහන් අංකය : ජේ. 57/58 ඇල් 523 (වීර්)/ඇල් එච්. 829.
1959 අප්‍රේල් මස 6 දින කොළඹදීය.

---

## ශුද්ධිය

අංකය : 3/62/4/57/58
ජේ 57 ඇල් ඊ 137.

1958 ජූලි 25 දින අංක 11,436 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයේ 6 වැනි පේලියේ සඳහන් උතුරට සහ නැගෙනහිරට මායිම "එම ඉඩමේ ඉතිරි කොටස" නොව "බෝගහ මුලවත්ත නමැති ඉඩම" විය යුතුයි.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සිතියමේ නො. ඒ. 4,302. ගම—ඊරියවැටිය.

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : ස්කෝලේවත්ත ; විස්තරය : අවුරුදු 50ක පොල් ගස් 34ක්, අවුරුදු 10, ජේ.ර. ගස් 6, අවුරුදු 2ක දෙඩම් ගහක්, අවුරුද්දක පුවක් ගහක්, කපරාරු කළ ඇස්බැස්ටස් සවිර ගොඩනැගිලි 3ක්, උළු සෙවිලි කළ සවිර ගොඩනැගිල්ලක් සහ කොන්ක්‍රීට් වැසිකිළි 2ක් ඇති පොල් ඉඩම ; අයිතිකම් කියන අය : පලිහවඩන ආරච්චිගේ ඇඩ්මන්ඩ් පෙරේරා, කිරිබත්ගොඩ, කැළණිය ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 0. එකතුව : අ. 1, රූ. 0, ප. 0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1959 ජූනි මස 16 වැනි දින පෙරවරු 10 වෙලාවට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1959 ජූනි මස 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අංකය : කිශු. බි. 267/ජේ 56 ඊ. 329.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩ බලන් අතිරේක උප ඒජන්ත.

1959 අප්‍රේල් මස 25 දින,
කොළඹ කච්චේරියේදීය.

---

යොමු අංකය : ඇල්ඒ 3667.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අංක ඒ 1,574 දරණ මූලික සැලැස්ම. ගම—පිලාකටුමුල්ල

**කට්ටි අංකය : 1.**

ඉඩමේ නම : අංක 2 දරණ රත්මල් වැව වත්ත ; විස්තර : අවුරුදු 40කට අධික වයසැති පොල් ගස් 204ක් සහිත පොල් වත්තක් ; හිමිකම් පාන්නාගේ නම : කොල්ලුපිටියේ සෙල්ලමුත්තු මාවතේ අංක 12 දරණ එච්. ඩබ්ලිව්. පීරිස් මහතා. ඒජන්තවරු :—කොළඹ කොටුවේ, කුමාර වීදියේ, ලොයිඩ් ගොඩනැගිල්ලේ සීමාසහිත ඇට්කින් ස්පෙන්ස් සහ සමාගම ; විශාලත්වය : අ. 2, රූ. 3, ප. 38.3 ; එකතුව : අ. 2, රූ. 3, ප. 38.3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959යේ මැයි මස 29 වැනි දින පූර්වභාග 9.30ට නාත්තන්ඩියේ ප්‍රා. ආ. නිලධාරිතැනගේ කායාීලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959යේ මැයි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජී. ඇම්. ස්පාර්ක්ස්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

1959 අප්‍රේල් මස 18 වැනි දින,
පුත්තලම් කච්චේරිය.

යොමු අංකය : ඇල් ඒ. 3597.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

අංක 2,137 දරණ අවසාන ගම් සැලැස්මේ 2 වැනි අතිරේකය
ගම—කරව්ටාගාර

**කට්ටි අංකය : 64.**

ඉඩමේ නම : කරවිට-අගාර වත්ත ; විස්තර : ලිදක්ද, අවු. 25ක කුඹුක් ගසක්ද, අවු. 40ක කොහොඹ ගසක්ද, අවු. 40ක කොස් ගසක්ද, අවු. 40ක හල්මිල්ල ගසක්ද, පාරේ වැටෙහි අවු. 30ක ලුනුමිදැල්ල ගස් 2ක්ද, අවු. 25ක කැටකැල්ල ගස් 3ක්ද, අවු. 25 සිට 40ට අධික වයසැති පොල් ගස් 302 සහිත අවු. 25 සිට අවු. 40කට අධික වයසැති පොල් වත්තක් ; අයිතිකම් පාන්නාගේ නම : මාදම්පේ සේනානායක වලව්වේ වාසල මුදලි ඇල්. ඇම්. ඩබ්ලිව්. සේනානායක ; ප්‍රමාණය : අ. 4, රූ. 1, ප. 33.0.

**කට්ටි අංකය : 65.**

ඉඩමේ නම : කරවිට-අගාර වත්ත ; විස්තර : අවු. 25 සිට අවු. 40කට අධික වයසැති පොල් ගස් 14ක් සහිත අවු. 25 සිට අවු. 40ක් වයසැති පොල් වත්තක් ; අයිතිකම් පාන්නාගේ නම : මාදම්පේ සේනානායක වලව්වේ, වාසල මුදලි ඇල්. ඇම්. ඩබ්ලිව්. සේනානායක ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.8.

**කට්ටි අංකය : 66.**

ඉඩමේ නම : කරවිට-අගාර වත්ත ; විස්තර : අවුරුදු 25ක කළුවර ගසක්ද. අවුරුදු 40කට අධික වයසැති පොල් ගස් 3ක්ද සහිත අවුරුදු 25ටත් අවුරුදු 40ටත් අධික වයසැති පොල් වත්තක් ; හිමිකම් පාන්නාගේ නම : මාදම්පේ සේනානායක වලව්වේ වාසල මුදලි ඇල්. ඇම්. ඩබ්ලිව්. සේනානායක ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 2.3.

**කට්ටි අංකය : 67.**

ඉඩමේ නම : කරවිට-අගාර වත්ත ; විස්තර : අවුරුදු 25ක පොල් ගසක් සහිත අවුරුදු 25ශේ සිට 40ට වැඩි වයසැති පොල් වත්තක් ; හිමිකම් පාන්නාගේ නම : මාදම්පේ සේනානායක වලව්වේ වාසල මුදලි ඇල්. ඇම්. ඩබ්ලිව්. සේනානායක ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 3.4. එකතුව : අ. 4, රූ. 2, ප. 21.5.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959යේ මැයි මස 28 වැනි දින පූ.භා. 10ට හලාවත ප්‍රා. ආ. නිලධාරි තැනගේ කායාීලයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1959 මැයි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජී. ඇම්. ස්පාර්ක්ස්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

1959 අප්‍රේල් මස 18 වැනි දින,
පුත්තලම් කච්චේරිය.

---

යොමු අංකය ඇල්ඒ. 3661.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950ශේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :—

අංක 1,575 දරණ මූලික සැලැස්ම. ගම—කන්දලෙයි

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : මන්ජාඩි කානි ; විස්තර : (අත්හරින ලද) අවුරුදු 60ක පොල් වත්තක් ; හිමිකම් පාන්නාගේ නම : පුත්තලමේ එච්. ඇස්. ස්මයිල් මහතා සහ ඇම්. හනීෆා ජවුෆර් මහතා ; විශාලත්වය: අ. 16, රූ. 0, ප. 14.

එකතුව: අ. 16, රූ. 0, ප. 14.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959යේ මැයි මස 27 වැනි දින පූ.භා. 10 ට කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1959යේ මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනිම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජී. ඇම්. ස්පාක්ස්,
ආණ්ඩුවේ ඒජන්ත, පුත්තලම් දිස්ත්‍රික්කය.

1959යේ අප්‍රේල් මස 24 වැනි දින
පුත්තලමේ කච්චේරිය.

---

මගේ අංකය : ඇල්ඇල්/ඒ 5708ඒ.

පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර තිබෙන අංක 12 දරන අවසාන ගම් සිතියමේ ලොට් නො. 100යේ 5/48ක කොටස වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල වන රු. 7.80 එම ඉඩම් කොටසට හිමිකම් කියන්නවුන් විසින් ලබා ගැනීම සඳහා රත්නපුර රික්වැස්ට් උසාවියේ අංක 18 දරණ නඩුවේ තැන්පත් කොට ඇති බව 1954දී අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 31 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන්පත් පුංචි බණ්ඩා මුදන්නායක වන මා විසින් දන්වා සිටිමි.

පී. බී. මුදන්නායක,
රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළයේ පන්නිල් පත්තුවේ වැල්ලන්දුර පිහිටි අංක 12 දරණ අවසාන ගම් සිතියමේ 5 වැනි අතිරේක ලොට් නොම්මර 100 මෙන් දක්වා තිබෙන වල්ගම්පොල හේන, වල්ගම් පොලකුඹුර, උඩදෙනිය කුඹුර නමැති ඉඩම.

---

සඳහන් කළ අංකය : ඇල්. ඇම්. 5654.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දන්වීමයි

මහාජන කාය්‍යීයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි:

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

ප්ලෑන් නො. පී. පී. ඒ 945—ගම : හිග්ගොඩ

**බිම්කට්ටි නො. 1.**

ඉඩමේ නම : තොවිලගොල්ලවත්ත ; විස්තර : පොල්ගස් 13ක්, කොස් ගස් 1ක්, අඹගස් එකක් සහ අවුරුදු 5ක් පමණ වයසැති පුවක්ගස් 5ක් සහිත ඉඩම ; හිමිකම් කියන අය : හෙම්මාතගම දඹුළුවැව කේ. පී. පී. ජයසේකර නෝනා මහත්මිය, කුරුණෑගල සේනානායක හෝටලේ ඇම්. සේනානායක ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 01.

**බිම්කට්ටි නො. 2.**

ඉඩමේ නම : හින්ගුරෙ වත්ත, පරණ කෝරාළගෙවත්ත ; විස්තර : පොල් ගස් 15ක් සහිත ඉඩම ; හිමිකම් කියන අය : හෙම්මාතගම, දඹුළුවැව කේ. පී. පී. ජයසේකර නෝනාමහත්මිය ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 39.1.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතා වන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1959 ජූනි මස 11 වෙනි දින උදේ 10ට උඩගොඩ ආණ්ඩුවේ ගොවිපලේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1959 ජූනි මස 4 වන දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇල්. බී. හුළංගමුව,
කෑගල්ල දිස්ත්‍රික්කය ආණ්ඩුවේ ඒජන්ත.

කෑගල්ල කච්චේරිය,
1959 අප්‍රේල් මස 22 දය.

---

# ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම්

## දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මා/කැටැන්විල රජයේ පාසැලේ දී වර්‍ෂ 1959ක්වූ ජූනි මස 13 වැනි දින පූ.භා. 10ට 1935හේ අංක 19 දරන ඉඩම් සශ්‍රිකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් මාතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගත යුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාග කළ යුතුයි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

### දීමට යන ඉඩම්වල විස්තර

| ප්ලෑනේ අංකය හා ගම | කැබැල්ලේ අංකය | අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| අ. ග. සි. 534 | | | | | |
| කැටැන්විල | 141 ඊ | හේවා දන්දෙනියෙගෙයි පොඩිනෝනා | 1 | 3 | 25 |
| ,, | 145එක්ස් | ගමගේ ජාමිස් ... | 2 | 0 | 27 |
| ,, | 141එෆ් | හේවා දන්දෙනියෙගෙයි කරෝලිස් අප්පු ... ... | 2 | 0 | 10 |
| ,, | 145බී | රනසිංහේවා මාතරගෙයි දියෝනිස්... | 1 | 3 | 32 |
| ,, | 145ඒජී | කඹුරුගමුවේ ලොකු ආචාරිගේ පීරිස්හාමි ... ... | 2 | 0 | 07 |
| ,, | 141ඒඑස් | අකුලහේන දූරාගේ උද්දේරිස් ... | 1 | 2 | 27 |
| ,, | 141ඒයූ | බංගම කරනායක කංකානම්ගේ දෙන් සියදෝරිස් ... | 1 | 3 | 32 |
| ,, | 141ජී | බංගම රනසිංගේ සුවාරිස් ... | 1 | 3 | 36 |
| ,, | 141සී | කරනායක කංකානම්ගේ කරෝලිස් ... | 2 | 0 | 03 |
| ,, | 141කිව් | මනාච්චිගේ සෙන්දිරිස් ... | 1 | 3 | 24 |
| ,, | 141ටී | බෙන්තොට වඩු ආචාරිගේ චාර්ලිස්හාමි | 2 | 0 | 07 |
| ,, | 141එන් | විජේසිංහ පන්ඩිප්පෙරුම ආරච්චිගේ දෙන් අර්නෝලිස් ... | 2 | 0 | 10 |
| ,, | 141අයි | බංගම ගමාච්චිගේ ජුවානිස් අප්පු ... | 1 | 0 | 15 |
| ,, | 141ඩී | එල්ලල ගොඩ ගමගේ දෙන්. කරෝලිස් | 2 | 0 | 23 |
| ,, | 145ඒඒ | දෙදියගල ගමාචාරිගේ සිංඤොහාමි... | 1 | 3 | 35 |
| ,, | 141ඒවී | සන්නසූරියගේ දෙන් අන්දිරිස් ... | 1 | 3 | 35 |
| ,, | 141ඒඑක්ස් | එල්ලලගොඩ ගමගේ සයිමන් | 1 | 3 | 33 |
| ,, | 145කිව් | බංගම සමරවික්‍රම ගමාච්චිගේ බෙන්පිස් ... ... | 1 | 3 | 16 |
| ,, | 145ඒඑච් | බෙන්තොට වඩු ආචාරිගේ එන්දෝරිස් හාමි ... ... | 2 | 0 | 11 |
| ,, | 141පී | ජයවික්‍රම නාරායන ගල්ගනගෙයි ඩේවිත් හාමි ... ... | 2 | 0 | 26 |
| ,, | 151ඒයූ | සන්නසූරියගේ දෙන් පේද්‍රික් ... | 1 | 3 | 09 |
| ,, | 141ඊ | ඩබ්ලිව්. ඒ. නෝනහාමි ... | 2 | 0 | 06 |
| ,, | 145ඒඊ | ජයවික්‍රම නාරායන ගලගනෝගෙයි චාර්ලිස් හාමි ... ... | 1 | 3 | 05 |

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්. 6707.

### 1948 ආණ්ඩුවේ ඉඩම් රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

1946යේ අංක 46වෙනි ආඥාපණතේ සංයෝජිත මුස්ලිම් ඉස්ලාම් සංස්කෘතික ආයතනය කොළඹ නාගරික සීමාව තුළ පිහිටි කොටුව කොට්ඨාශයේ අංක පීපීඒ. 4,093 දරණ පිඹුරේ 1වෙනි බිම්කට්ටියෙන් පර්චස් 33.55 පමණ බිම් කැබෙල්ලක් මුස්ලිම් ඉස්ලාම් සංස්කෘතික ආයතනයේ මධ්‍යස්ථානයකට බිම් පෙදෙසක් වශයෙන් බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බැව් මහජනයාට මෙයින් දන්වමි. ආයතනයේ මූලික අරමුණ නම් තරුණයින්ට ලැගුම් සහ විනෝද පහසුකම් සලසා දීමය.

2. මේ ඉල්ලීම පරිදි ආණ්ඩුවේ කොන්දේසිවලට යටත් කොට ඉඩම් කැබෙල්ලක් දීමට ආණ්ඩුවේ අදහස තිබේ. ඒ කොන්දේසි වලින් සමහරක් මෙසේය :—

(අ) කාලය : අවුරුදු 99යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රුපියල් 3,125යි ;

(උ) හයමාසයක් කල්දී බද්ද අවලංගු කිරීම උභය පක්ෂයට බලය තිබේ ;

(ඒ) කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් කලින් ලියවිල්ලකින් අවසරයක් ලබානොගෙන බදුකාරයා විසින් මෙම ඉඩමේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතුයි ;

(ඔ) බදුකාරයා විසින් මෙම ඉඩමේ තට්ටු පහක ගොඩනැගිල්ලක් තැනීමට ඉඩම යෙදවිය යුතුය. ගොඩනැගිල්ලේ සමිති ශාලාවක්, ලැගුම් ගෙයක්, ව්‍යායාම ශාලාවක් සහ විනෝද කටයුතු සඳහා කාමරයක් අන්තර්ගත විය යුතුය. බිම මාලය භෝජන ශාලාවක් සඳහා යෙදවිය හැක. ඒ හැර එය වෙළඳ කටයුතු සඳහා මාස් කුලියට බද්දට දිය හැක.

මෙහි සඳහන් දිනයේ පටන් සුමාන හයක් ඇතුළතදී ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සෑහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් කළහොත් මිස නැත්නම් මේ ඉල්ලීම අනුව මේ බද්ද දෙන්නෙමි.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1959 අප්‍රේල් මස 30වෙනි දින,
කොළඹ.

---

### අනුරාධපුර නව නගරයේ වෙළෙඳාම් කටයුතු සඳහා බිම් කොටස් බදු දීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් අනුරාධපුර නව නගරයේ වෙළෙඳාම් කටයුතු සඳහා පහත සඳහන් ප්‍රදේශයේ බිම් කොටස් 30ක් බදු දීම වස් අයදුම්පත් කැඳවනු ලැබේ:—

**මෙකී වෙළෙඳ ප්‍රදේශ අංක 1.**

උතුරට : ඩික්සන් පාර ; නැගෙනහිරට : නුවරවැව වැව් බැම්ම ; දකුණට : වාන් ඇළ ; බස්නාහිරට : දුම්රිය ස්ථානය සම්මුඛවීමේ පාර හා ඩික්සන් පාර හමුවන හන්දියෙන් පටන්ගෙන ලංකා බැංකු ගොඩනැගිල්ල දක්වා වැටී ඇති පාර.

මේවා මෙකී ප්‍රදේශයෙහි පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් කොටස් 10කි. අඩි 66ක් දිග අඩි 50ක් පළල කෑලි 1යි ; එකක් අඩි 70ක් දිග අඩි 15ක් පළල කෑලි 3යි ; එකක් අඩි 40ක් දිග අඩි 15ක් පළල කෑලි 5ක් සහ අක්කර ¼ලේ කැබැලි 1යි.

**මෙකී වෙළෙඳ ප්‍රදේශ අංක 2.**

මෙකී ප්‍රදේශයේ නව නගරයේ පිහිටි බැංකු ගොඩනැගිල්ලට ආසන්නව නව නගරයේ අළුත් පාරවලට දෙපැත්තෙන් පිහිටා ඇත. මෙකී පෙදෙස් පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් කොටස් 14කි.

අඩි 70ක් දිග අඩි 15ක් පළල කැබැලි 7යි ; අඩි 100ක් දිග අඩි 20ක් පළලල කැබැලි 5යි ; අක්කර ¼ බිම් කැබැලි 2යි.

සෙසු ඉඩම් කට්ටි 6 නව නගරයේ නිර්මාන සැළැස්මේ ඊවී යන්නෙන් විස්තර කර ඇති පාර අසළ අක්කර ¼කින් යුත් කැබැලි වේ.

2. මෙකී ඉඩම් බදු දීමට සුදුසු අය තෝරීමේදී පහත සඳහන් ප්‍රමුඛත්වය පිළිපදිනු ලැබේ :—

(අ) අනුරාධපුර සංරක්ෂක ක්‍රමය යටතේ සුරක්ෂිත බිම් ප්‍රදේශයට වෙන්කිරීම සඳහා පැරණි නගරයේ රජයට ගත් වෙළෙඳාම වෙනුවෙන් යොදවා තිබූ බිම් කැබැලි හිමිව හෝ බදු ගෙන සිටි අයවළුන් හා එකී ප්‍රදේශයේ දැනට කඩා දමා ඇති වෙළෙඳාමට යෙදුවාවූ ගොඩනැගිලි කුලියට ගෙන සිටි අයවළුන්.

(ආ) අනුරාධපුර නව නගරයේ 1වෙනි කොටසේ වෙළෙඳාම් පෙදෙස් හිමිව ඒවා නව නගරය සංවර්ධනය සඳහා රජයට ගත් අයවළුන්.

(ඉ) අනුරාධපුර සංරක්ෂක පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ලබාගන්නා බවට දන්වා ඇති වෙළඳාමට සුදුසු ඉඩම් හිමියන් ඒ අය එම ඉඩම් ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩුවශයෙන් අවුරුදු පහක්වත් අඛණ්ඩව එම ඉඩම් අයිතිකරුවන්ව සිටි අය විය යුතුයි.

(ඊ) අනුරාධපුර පැරණි නගරයේ වෙළෙඳාම සඳහා යෙදුවාවූ ඉඩම් හිමිව සිටි අය. මේ අය ඒවා රජයට ගන්නා බව දැන්වූ දිනට අන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක්වත් එකී ඉඩම්වල අඛණ්ඩව අයිතිකරුවන්ව සිටි අය විය යුතුයි.

(උ) අනුරාධපුර සංරක්ෂිත ක්‍රමය යටතේ සුරක්ෂිත බිම් ප්‍රදේශයට වෙන් කිරීම සඳහා පැරණි නගරයෙන් රජයට ගත් වෙළෙඳාම් පෙදෙස් හැර අන් ඉඩම් හිමිව හෝ බදු ගෙන හා එකී ප්‍රදේශයේ දැනට කඩා දමා ඇති යම් ගොඩනැගිල්ලක කුලියට සිටිය අයවළුන්.

(ඌ) අනුරාධපුර සංරක්ෂක පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ගන්නා බවට දන්වා ඇති වෙළඳාමට සුදුසු ඉඩම් හැර අන් ඉඩම් හිමියන් ඒ අය එම ඉඩම් ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩුවශයෙන් අවුරුදු පහක්වත් අඛණ්ඩව මෙම ඉඩම් වල අයිති කරුවන් වී සිටි අය විය යුතුයි.

(එ) අනුරාධපුර පැරණි නගරයේ වෙළෙඳාමට සුදුසු ඉඩම් හැර අන් ඉඩම් හිමි අය. මෙම ඉඩම් ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක් තුළ අඛණ්ඩව මෙම ඉඩම් හිමියන්ව සිටිය අය විය යුතුයි.

(ඒ) නව නගරය සංවර්ධනය කිරීම් වස් අනුරාධපුර නව නගරයේ 1වෙනි 2වෙනි කොටස්වලින් රජයට ලබාගත් ඉඩම්වල අයිති කරුවන්.

(ඔ) අනුරාධපුර සංරක්ෂක පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ගන්නා බවට දක්වා ඇති නව නගරයේ 1වෙනි 2වෙනි කොටස්වල ඉඩම් හිමි අයවළුන්, ඒ අය මෙම ඉඩම් මෙසේ ලබාගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක් තුළ අඛණ්ඩව මෙම ඉඩම්වල අයිති කරුවන්ව සිටිය යුතුයි.

(ඕ) අනුරාධපුර පැරණි නගරයේ ඉඩම් නොමැති එහෙත් එහි ස්ථිර පදිංචියට ස්ථානයක් ඇත්තාවූ අයවළුන්.

මීට අමතර අයවළුන්ගෙන් ඉල්ලුම්පත් ගැන සළකා බලනුයේ මෙකී අයවළුනට ඉඩම් දී තවත් ඉතිරිව තිබුනොත් පමණකි.

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් ප්‍රකාර වෙළෙඳාම් බිමක් හිමිව, බදුගෙන හෝ කුලියට ගෙන සිට එය සංරක්ෂිත පෙදෙස වෙනුවෙන් රජයට ගනු ලැබ හෝ එවැන්නක් රජයට ගන්නා බවට දන්වා ඇති යම් අයෙකුට නව නගරයෙන් වෙළෙඳාම් ගොඩනැගිල්ලක් දැනටමත් රජයෙන් දී තිබේ නම් ඔහු මීට සුදුස්සෙක් වනුයේ මෙම ඉඩම ලැබූ විට එහි ගොඩනැගිලි සෑදූ වහාම යථෝක්ත රජයේ ගොඩනැගිල්ල අත් හැරීමට පොරොන්දු වන්නේ නම් පමණකි.

3. මෙම ඉල්ලුම් පත් එවන විට "දිසාපති තුමා, අනුරාධපුරය" කියා එවිය යුතුයි. තවද එම ඉල්ලුම් පත් වර්ෂ 1959 මැයි මස 20වෙනි දින උදය 10 හෝ ඊට ප්‍රථම එතුමාට ලැබෙන්නට සැළැස්විය යුතුයි. සෑම ඉල්ලුම් පතකම වෙනත් කරුණු අතර පහත සඳහන් විස්තර අඩංගු විය යුතුයි. එකී විස්තර :—

(අ) රජයට ගනු ලැබූ හෝ ගැනීමට අදහස් කර ඇති ඉල්ලුම්කරු සතුවූ හෝ පදිංචිවූ වෙළෙඳාම සඳහා යෙදුවාවූ ඉඩම්වල හෝ අන් ඉඩම්වල සම්පූර්ණ විස්තර.

(ආ) ඉල්ලුම්කරු බදු ගැනීමට අදහස් කරන ඉඩමේ ප්‍රමාණය.

4. තෝරාගනු ලැබූ සෑම ඉල්ලුම්කරුවෙකුම වෙනත් කරුණුවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලට යටත් බද්දකට ඇතුළත් වීමට අවශ්‍ය වේ:—

(අ) බද්ද දෙනු ලබන්නේ අවුරුදු 99කටයි.

(ආ) බදුකරු ඉඩම වෙනුවෙන් එහි මුඩුබිමේ වටිනාකමෙන් සියයට හතර ගණනේ ගණන් බැලූ වාර්ෂික බදු මුදලක් ගෙවිය යුතුයි.

(ඉ) බදුකරු වර්ෂ දෙකක් ඇතුළතදී තමාගේම වියදමින් රජයේ නගර නිර්මාණ ශිල්පියා විසින් පළමුව අනුමත කරන ලද සැළැස්මකට අනුව මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් සාදා නිම කළ යුතුයි.

(ඊ) බදුකරු බද්ද ගත් දින සිට අවුරුද්දක් ඇතුළතදී ගොඩනැගිල්ල සෑදීමට පටන් ගත යුතුයි.

(උ) බදු කරුවන් ඉඩම වෙළඳාම සඳහා හැර අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදිය යුතුයි.

5. බදුකරුවන් තෝරීමේ ඉඩම් කච්චේරිය වර්ෂ 1959 මැයි මස 28වෙනි දින උදය 10ට අනුරාධපුර කච්චේරියේදී පවත්වනු ලැබේ. සෑම ඉල්ලුම්කරුවකුම හෝ තමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද කෙනෙක් හෝ මෙකී ඉඩම් කච්චේරියේදී පෙනී සිටිය යුතුයි.

6. ඉඩම් පිහිටි ස්ථාන හෝ මේ පිළිබඳ වෙනත් විස්තර දිසාපති තුමාගෙන් දැන ගත හැක.

ඩී. සී. ඇල්. අමරසිංහ,
අනුරාධපුර දිසාපති තුමා.

නව ලේකම් කාර්‍යාලය,
අනුරාධපුරය, 1959.4.25.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී